# ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය
# Ananda College Old Boys' Association

ආනන්ද විද්‍යාලය,
කොළඹ 10.
2020 දෙසැම්බර් 15

මහත්මයාණෙනි/මහත්මියණි,

## (2021/2022) වර්ෂය සඳහා විධායක මණ්ඩලය තෝරා ගැනීම පිණිස නාම යෝජනා කැඳවීම.

**01. 2020/2021 වර්ෂය සඳහා මහා සභා රැස්වීම 2021 මාර්තු මස 27 වැනි සෙනසුරාදා පෙ.ව. 9.00ට කොළඹ ආනන්ද විද්‍යාලයීය කුලරත්න ශාලාවේදී පවත්වනු ලැබේ.**

1.1 2021/2022 වර්ෂයට විධායක මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා නාම යෝජනා කැඳවනු ලැබේ.

සම ලේකම් ධූර 02 උප සභාපති ධූර 04යි
කාරක සභික ධූර (පහත 02 (අ) හා 02 (ආ) හි දැක්වෙන පරිදි)

1.2 ඉහත සඳහන් සියළු තනතුරු සඳහා නාම යෝජනා පත්‍ර ව්‍යවස්ථාවේ 25.5 වගන්තියේ පරිදි සාමාජිකයන් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් කළ යුතුය. තවද එකී නාම යෝජනා පත්‍ර ව්‍යවස්ථාවේ 25.4 ඡේදයෙහි සඳහන් පරිදි නිල ආකෘති පත්‍රය මගින් තොරතුරු නිසි පරිදි සම්පූර්ණයෙන් පුරවා එවිය යුතුය. අසම්පූර්ණව පුරවා ඇති නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

1.3 **උප සභාපති සහ සම ලේකම්,** ධූරයන් සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැක්කේ, පිළිවෙලින් අවම වශයෙන් වසර පහක (05) හා වසර හතරක (04) අවුරුදු කාල සීමාවක් විධායක මණ්ඩලයේ සාමාජිකත්වය දරන ලද සහ ඉන් එක් වර්ෂයක් හෝ ආසන්නතම වර්ෂයේ වූ අයකු හට පමණි. එසේ වුවත් උප ලේකම්වරයෙකු ලෙස අවම වශයෙන් වසර දෙකක් කටයුතු කළ අයකුටද, සමලේකම් ධූරයන් සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැකිය.

1.4 **උප සභාපති** සහ **සම ලේකම්** යන එක් එක් තනතුර සඳහා අඛණ්ඩව වසර තුනකට වඩා පත්විය නොහැකිය. එසේ වුවද වසරක විරාමයකින් පසුව නැවත පෙර දරන ලද ධූරය සඳහා වුවද නාම යෝජනා ඉදිරිපත් කළ හැකිය.

1.5 **විධායක මණ්ඩලයේ කාරක සභික** ධූරයක් දැරීමට සුදුසුකම් ලබන්නේ එම වාර්ෂික මහා සභා රැස්වීමට කලින් අඛණ්ඩව අවුරුදු තුනක (03) කාලයක් සංගමයේ සාමාජිකත්වය දැරූ සාමාජිකයන් හට පමණි. (වයස අවුරුදු 30ට අඩු සාමාජිකයන්ට මෙය බලනොපායි.)

1.6 ව්‍යවස්ථාවේ 10.7(ඇ) වගන්තිය අනුව විධායක මණ්ඩලයේ සාමාජිකත්වය අහෝසි වූ සාමාජිකයෙකුට ඉන් ඉක්බිතිව එළඹෙන මහා සභා රැස්වීමට පසු වර්ෂය තුළ විධායක මණ්ඩලයේ කවර හෝ තනතුරක් දැරීමට නොහැක.

9.2.3, 9.2.6 (උ), 9.2.7 වගන්තිය යටතේ පත්වන සාමාජිකයන්ට මෙම වගන්ති බල නොපායි.

**02.(අ) කාරක සභික ධූරයන් 40 පහත සඳහන් පරිදි පුරවනු ලැබේ.**

2.1 වයස අවුරුදු 60 හෝ ඊට වැඩි අය සඳහා තනතුරු 05 යි.
2.2 වයස අවුරුදු 50 ට වැඩි 60 ට අඩු අය සඳහා තනතුරු 05 යි.
2.3 වයස අවුරුදු 50ට අඩු හෝ 40ට වැඩි අය සඳහා තනතුරු 10 යි.
2.4 වයස අවුරුදු 40ට අඩු හා 30ට වැඩි අය සඳහා තනතුරු 15 යි.
2.5 වයස අවුරුදු 30ට අඩු අය සඳහා තනතුරු 05 යි.

(වයස ගණන් ගත යුත්තේ 2021 ජනවාරි 31 දිනටය.)

**වාර්ෂික මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය අනුව විධායක මණ්ඩලය තෝරා පත්කරගන්නා අවස්ථාවේදී අපේක්ෂකයා අනිවාර්යයෙන්ම සභා ගැබේ රැඳී සිටිය යුතුවේ. යම් හෙයකින් නාම යෝජනා ඉදිරිපත් කර ඇති අපේක්ෂකයා මහා සභා රැස්වීමට නොපැමිණෙන්නේ නම් හෝ පැමිණීමට නොහැකි වන්නේ නම් ඒ සඳහා පිළිගත හැකි හේතු සභාපතිට ලිඛිතව ඉදිරිපත් කල යුතුය. ඒ පිළිබඳ අවසාන තීරණය සභාපති සතුය.**

**02 (ආ) සංගමයේ අනුබද්ධිත සංවිධාන නියෝජනය සඳහා කාරක සභිකයින්**

2.1 සංගමයේ අනුබද්ධිත සංවිධාන සඳහා, එක් සංවිධානයක් නියෝජනය පිණිස එක් සාමාජිකයෙකු බැගින් යෝජනා කළ හැක.

2.2 එකී නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ ලියාපදිංචි සංවිධානයේ විධායක කමිටුවෙහි යෝජනා ස්ථිරත්වයෙන් එම සංවිධානයේ සභාපති හෝ ලේකම් විසින්ය.

2.2.1 එසේ නම් කරන සාමාජිකයා, නාම යෝජනා භාර ගන්නා අවසාන දින වන විට එම අනුබද්ධ සංවිධානයේ සභාපති, උප සභාපති, ලේකම්/සම ලේකම් හෝ භාණ්ඩාගාරික විය යුතුය.

2.2.2 මීට අමතරව ව්‍යවස්ථාවේ 9.2.6 (එ) අනුව සියළුම වයස් කාණ්ඩ වලට අදාල අනුබද්ධිත කණ්ඩායමකින් එක් වසරකට අදාලව එක් සාමාජිකයෙකු බැගින්, අදාල අනුබද්ධිත කණ්ඩායමේ අනුමැතියට යටත්ව ඉදිරිපත් කළ හැකිය.

**සැ.යු. ව්‍යවස්ථාවේ 11.5 අනුව කිසිදු සාමාජිකයෙකුට විධායක සහ / හෝ කළමණාකාර කමිටුවේ කිසිදු තනතුරු දෙකකට එක් වර්ෂයක් තුල දී නාම යෝජනා ලබා දිය නොහැකිය.**

3. අප සංගමයේ ව්‍යවස්ථාවේ 25.2 වැනි ඡේදයට අනුකූලව නාම යෝජනා 2021 ජනවාරි 29 වැනි සිකුරාදා දින පස්වරු 4.00ට හෝ ඊට ප්‍රථම සංගමයේ සම ලේකම්වරුන්ට ලැබෙන සේ බාර දී බාර දෙන අයදුම්පත් සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය. තවද විද්‍යුත් තැපැල මගින් අයදුම් කරනු ලබන අපේක්ෂකයින් සම්පූර්ණ කරන ලද අයදුම්පත 2021 ජනවාරි 29 වන දින සවස 4.00ට පෙර acoba@sltnet.lk වෙත යොමු කළ යුතුවේ.

4. නාම යෝජනා සඳහා අයදුම්පත් සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්හි කොළඹ 10, ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කාර්යාලයෙන් 2021 ජනවාරි මස 28 වෙනි දින දක්වා පෙරවරු 9.00 සිට පස්වරු 6.00 දක්වා කාලය තුළ ලබාගත හැක. මෙවර අයදුම්පත් ආදි ශිෂ්‍ය සංගමයේ වෙබ් පිටුවට පිවිසීම තුළින් (anandacollegeoba.org) බාගත කරගත ගැනීමටද හැකියාව ඇත.

5. මෙම වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කිරීමට යෝජනා වෙතොත්, එම යෝජනා 2021 ජනවාරි 29 දින හෝ ඊට පෙර ව්‍යවස්ථානුකූලව, සංගමයේ සම ලේකම්වරුන් වෙත ලැබෙන පරිදි ආදි ශිෂ්‍ය සංගමය ආනන්ද විද්‍යාලය කොළඹ 10, යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් හෝ ආදි ශිෂ්‍ය සංගමය වෙත භාර දී කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ස්තුතියි

අ.ක.
**සුජීව රත්මහල්**
සම ලේකම්

අ.ක.
**දිනුක චන්ද්‍රකීර්ති**
සම ලේකම්

**PRINTED MATTER**

**සම ලේකම්**
**ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය,**
**ආනන්ද විද්‍යාලය**
**කොළඹ 10.**